# මහින්ද රාජපක්ෂ විද්‍යාලය, හෝමාගම.

## දෙවන වාර පරීක්ෂණය - 2013

## ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය

## 7 ශ්‍රේණිය

කාලය : පැය 2 යි

| | |
|---|---|
| I පත්‍රය | |
| II පත්‍රය | |
| එකතුව | |

නම : ......................................................................    පන්තිය : ..................

### I කොටස

- ප්‍රශ්න සියල්ලම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. මුද්‍රිත පණිවුඩයක් ඒ ආකාරයෙන් ම යැවිය හැකි තාක්ෂණික මෙවලම වන්නේ,
   i. ගුවන් විදුලිය    ii. ෆැක්ස් යන්ත්‍රය
   iii. විදුලි පණිවුඩය    iv. මුද්‍රණ යන්ත්‍රය

02. "චිත්‍ර කර්මය අභ්‍යාස කරන්නා සේ කුඩා කල සිටම සත්ගුණ අභ්‍යාස කළ යුතුය." මෙසේ පැවසුවේ,
   i. මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා    ii. මාර්ටින් වික්‍රමසිංහ සූරීන්
   iii. අනගාරික ධර්මපාල තුමා    iv. ග්‍රීක දාර්ශනික ප්ලේටෝ

03. ශ්‍රී ලාංකික වෙළඳපොළේ දැකිය හැකි කාන්තා පුවත්පතක් නොවන්නේ,
   i. රජිණ    ii. නවලිය
   iii. ගැමිලිය    iv. තරුණී

04. ගෘහස්ථ ක්‍රීඩාවක් නොවන්නේ,
   i. පිහිනීම    ii. දාම් ඇදීම
   iii. වෙස් ක්‍රීඩාව    iv. පංච ඇළීම

05. යමක් මුළුමනින් ම විනාශ කරමින් ප්‍රතිඵල නොගත යුතු බව ගැන කියවෙන සාරධර්මානුකූල ප්‍රස්තා පිරුළ වන්නේ,
   i. අගේ ඉඳන් කන කනවා වාගේ    ii. මුහුද කැඳ වුණත් කැඳරයාට මදිලූ
   iii. අතු කඩා මොර කනවා වාගේ    iv. කවුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ

06. ශ්‍රී ලංකාවේ නවකතා සක්විති ලෙස හඳුන්වන ශ්‍රේෂ්ඨ ලේඛකයා වන්නේ,
   i. ඩබ්ලිව්.ඒ. සිල්වා මහතා    ii. කුමාරතුංග මුණිදාස මහතා
   iii. කුලසේන ෆොන්සේකා මහතා    iv. පියසේන කහඳගමගේ මහතා

07. පවුලක් තුළ පරම්පරා කිපයක් තිස්සේ, දීර්ඝ කාලයක් තුළ පවත්වාගෙන එනු ලබන පිළිවෙත් හඳුන්වනු ලබන්නේ,
   i. යුතුකම් ලෙස ය.    ii. සම්ප්‍රදායන් ලෙස ය.
   iii. සංස්කෘතිය ලෙස ය    iv. සංහිඳියාව ලෙස ය

08. මුද්‍රිත මාධ්‍යයක් නොවන්නේ,

i. පුවත්පත් ii. පොත් පත්

iii. රූපවාහිනිය iv. අත් පත්‍රිකා

09. අන්තර් සබඳතා ඇතිවීම කෙරෙහි බලපාන සාධකයක් නොවන්නේ,

i. ආර්ථික අවශ්‍යතා ii. අධ්‍යාපනික අවශ්‍යතා

iii. දේශපාලනික හේතු iv. ආත්මාර්ථකාමීත්වය

10. "ඔබ පතන ඕනෑම අයකු වීමට, ඕනෑම දෙයක් කිරීමට ඔබට ශක්තියක් ඇත. ඔබ ඇත්තෙන්ම ආශ්චර්යවත් ය." මෙසේ පැවසුයේ,

i. පැබ්ලෝ කසල් නැමති අධ්‍යාපනඥයා ii. ගී ද මෝපසාං නැමති ලේඛකයා

iii. ඒබ්‍රහම් ලින්කන් මහතා iv. මැක්සිම් ගෝර්කි මහතා

- **නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න**

11. කෙනෙකුගේ උපන්දිනය නිවැරදිව දැනගත හැකි මූලික ලේඛනය ........................................ ........................................ යි.

12. සියලු සැප සම්පත් තිබුණත් සේවකයන් සමඟ කුඹුරු යි සෑම, අස්වනු නෙළීම, සතුන්ට තණකොළ කැපීම ආදී කටයුතුවල යෙදුනු, තම ආවාහන් යුගලය තමාම සාදා ගත් ශ්‍රේෂ්ඨ ලේඛකයා වන්නේ ........................................................................................

13. විවිධ වෘත්තීන්හි නිරතවන පුද්ගලයෝ වැඩකිරීමේදී කායික හා .................... වශයෙන් වෙහෙසට පත්වෙති.

14. අප මුලින්ම සාමාජිකත්වය ලබන සමාජ ඒකකය ............................................ යි.

15. අප රටේ පුරවැසියන්ට මූලික අයිතිවාසිකම් පනවා ඇත්තේ .................................... මගිනි.

- **පහත සඳහන් ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

16. ජන මාධ්‍ය මගින් රටක මෙන්ම සමස්ත ලෝකයේ ද ජන සමාජ ඒකරාශී කරන ක්‍රියාවලියක් සිදුවේ. ( )

17. ඔබේ පියාගේ මල්ලීගේ බිරිඳ ඔබේ නැන්දා ය. ( )

18. පුද්ගල සංවර්ධනයෙහි ලා පුද්ගලයා සතු හැකියාවන් හා ගුණ ධර්ම ඉතා වැදගත් වේ. ( )

19. අපගේ නිශ්චිත ඉලක්කයට ලඟා වීමට අපහසු වූ විට ඒ සඳහා විකල්ප මාර්ග භාවිතා කිරීම නොකළ යුතුය. ( )

20. සමාජයක් සතු පොදු දේපළ ආරක්ෂා වන විට සමාජ පහසුකම් වැඩි දියුණු වන්නේ නිතැතිනි. ( )

(ල. 02 × 20 = 40)

## II කොටස

- **පළමුවැනි ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

01. ජීවන නිපුණතා විෂය යටතේ ඔබගේ ගුරුතුමාගේ/ ගුරුතුමියගේ උපදෙස් අනුව "සාරධර්ම සුරකිමු" යන පාඩමට අදාළව කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ඔබ ඉදිරිපත් කළ භූමිකා රංගනය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඔබ ඉදිරිපත් කළ භූමිකා රංගනයෙන් මතුකර දැක්වූ සාරධර්මය කුමක් ද? (ල. 02)
ii. භූමිකා රංගනය ඉදිරිපත් කිරීමේදී ඔබට ලැබුණු චරිතය කුමක් ද? (ල. 02)
iii. ඔබ ඉදිරිපත් කළ භූමිකා රංගනය නිර්මාණය කිරීමට පදනම් කරගත් සිද්ධිය කුමක් ද? (ල. 04)
iv. එම භූමිකා රංගනයට සහභාගී වීමෙන් ඔබ තුළ වර්ධනය වූ කුසලතා 02 ක් ලියන්න. (ල. 04)
v. ඔබ ඉදිරිපත් කළ භූමිකා රංගනයට පාදක වූ සාරධර්මය සමාජයේ යහපතට හේතුවන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)

02. විවේකය සියලු දෙනාටම අවැසි වේ. විවේකයෙන් අපට ලැබෙන ප්‍රයෝජන බොහෝය.

i. විනෝදාංශ යනු මොනවා ද? (ල. 02)
ii. ඔබේ විනෝදාංශ 02 ක් ලියන්න. (ල. 02)
iii. ඔබට විවේක කාලය තුළ යෙදිය හැකි සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් 03 ක් ලියන්න. (ල. 03)
iv. ක්‍රීඩා හා විනෝදාංශ තුළින් ලැබෙන ප්‍රයෝජන 04 ක් දක්වා ඉන් 02 ක් ක්‍රීඩා හා විනෝදාංශවල නිරත වීම තුළින් ලැබෙන අයුරු පැහැදිලි කරන්න. (ල. 04)

03. වේයන් රැලක් තම ගෙවත්තේ වේ තුඹසක් තනා තිබෙනු කල්ප දුටුවේය. ඔහුගේ සිත දිවගියේ එදින ජීවන නිපුණතා විෂයේ දී සාකච්ඡා කළ අපේ ජන සමාජය පාඩමයි.

i. අපේ ජනසමාජයේ ද කෘමි සත්ව ලෝකයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් දක්නට ඇත. එය කුමක් ද? (ල. 02)
ii. ශ්‍රී ලාංකික ජන සමාජය සැදුම්ලත් ප්‍රධාන ජන වර්ග 04 ක් දක්වන්න. (ල. 02)
iii. මූලික මිනිස් අයිතිවාසිකම් 03 ක් දක්වන්න. (ල. 03)
iv. අන්තර් සබඳතා පවත්වන සමාජ ආයතන 04 ක් ලියා sඑම ආයතන 02 කින් වන සේවාවන් ලියන්න. (ල. 04)

04. දත්ත හා තොතුරු වලට නූතන සමාජයේ විශේෂ ස්ථානයක් ලැබී ඇත.

i. පුද්ගලයෙකුගේ දත්ත හා තොරතුරු ඇතුළත් ලේඛන 02 ක් ලියන්න. (ල. 02)
ii. තොරතුරු යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද? (ල. 02)
iii. ඔබගේ පාසල පිළිබඳව ඔබ මෙතෙක් අධ්‍යයනය කළ කරුණු ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   a. පාසලේ නම
   b. පාසල් වර්ගය
   c. පාසලෙහි ආරම්භක වර්ෂය
   d. පාසල ආරම්භයෙහි සිටි ගුරු සංඛ්‍යාව
   e. පාසල පිහිටි පළාත
   f. පාසල අයත් අධ්‍යාපන කලාපය (ල. 03)
iv. විද්‍යුත් මාධ්‍යය යටතේ දත්ත හා තොරතුරු ලබාදෙන උපකරණ 02 ක් ඇඳ ඒවායින් සිදුවන සේවාවන් 02 ක් ලියන්න. (ල. 04)

05.

i. ආත්මාභිමානය යනු කුමක් ද? (ල. 02)
ii.



ඉහත රූපයෙන් දැක්වෙන පුද්ගලයා කවුද? (ල. 01)
iii. ඔහු සතු උදාර ගුණධර්ම 02 ක් ලියන්න. (ල. 02)
iv. 8 ශ්‍රේණියට ස්ථිර වශයෙන්ම ඇතුළත් වීමට සිටින ඔබතුළ ඇතිකරගත යුතු උදාර අරමුණු 03 ක් ලියන්න. (ල. 03)
v. ඔබේ සිතට අභිමානයක් ගෙනදුන් ඔබේ සත්‍ය අත්දැකීමක් පේළි 05 කින් පමණ කෙටියෙන් ලියන්න. (ල. 03)

06.

i. පවුලක් යනු කුමක් ද? (ල. 02)
ii. ඥාතීත්වය පිළිබඳ කියවෙන දරුනැළවිලි ගීතයක් ලියන්න. (ල. 02)
iii. පවුලෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 04 ක් ලියන්න. (ල. 02)
iv. පවුලේ සාමාජිකයෙකු වශයෙන් ඔබ සතු යුතුකම් 02 ක් ලියන්න. (ල. 02)
v. පවුල තුළින් බිහිවන යහපත් පුරවැසියෙකු සතු ගුණාංග 02 ක් ලියන්න. ඉන් එක් ගුණාංගයක් ගෙන එම ගුණාංගය පවුල සමඟ ජීවත්වීමේදී ඔබ තුළ වර්ධනය වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ල. 03)

07. පහත සඳහන් ගීතය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පිං සිදු වන්නේ - අනේ බාල ළමුන්නේ
මගේ කූඩා නිවස කඩා - බිම නොදමන්නේ
වනේ පුරා සොයා ගොසින් - කෝටු කඩාලා
කූඩා කූඩා කැබලි තුඩින් - මෙහි ගෙනවිල්ලා
ගසේ මුදුන් අත්ත උඩින් - කෝටු තබාලා
උදේ පටන් දවස පුරා - කූඩු තනාලා

කොළේ කොළේ දමා කූඩා නිවස සදන්නේ
මගේ දයා බිරිඳ නිතර එය සරසන්නේ
රැලේ රැලේ පුළුන් දමා යහන සදන්නේ
අගේ මටයි ළදරුවනේ එය නොකඩන්නේ

මෙදා මගේ නිවස ඇතා සතුට වඩාලා
උදාර වූ කිරිල්ලිගේ දරුවො පිරීලා
එදා අනේ අපට ගලෙන් ගැසුව සියල්ලා
වැදා කියමි මගේ පුතුන් හෙම නොමරල්ලා

දෙමව්පියන් සෙනේ වෙතේ තම දරුවන්ටා
ළමා ඔබෙන් අපට නැතේ මිහිපිට ඉන්ටා
සමා වෙලා මෙ අප වෙතේ දිවි රැක ගන්ටා
නමා යදිමි දෙන්න අනේ මෙතැන රැඳෙන්ටා

(ආර්.එන්.එච්. පෙරේරා)

i. ඉහත ගීතය තුළ ඔබ දුටු චරිත 02 ක් නම් කරන්න. (ල. 02)
ii. ගීතයට අනුව කුඩා ළමුන්ගෙන් කවියා කරන ඉල්ලීම කුමක් ද? (ල. 03)
iii. “මෙදා මගේ නිවස ඇතා සතුට වඩාලා - උදාර වූ කිරිල්ලිගේ දරුවො පිරීලා” යන ගීත ඛණ්ඩයෙන් කියවෙන අදහස ලියා දක්වන්න. (ල. 03)
iv. ඉහත ගීතය රස විඳීම තුළින් ඔබ ඉගෙනගත් සාරධර්මය කුමක් ද? (ල. 03)